# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 53 — 1973 මාර්තු 30 වැනි සිකුරාදා — 1973.03.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 393 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 410 |


# තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දමස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට නම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත් වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණය කට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

අවුරුද්දකට රු. 3,864 වැටුප් පියවරේ තබනු ඇත. මේ අයද පත්වීමේ දින සිට අවුරුද්දක් ඇතුළත දී දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් නියමිත කාලය තුළ සමත් වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාදවීමට හේතු වේ. පත්වීමේ දින සිට අවුරුද්දක් ඇතුළත දී දෙපාර්තමේන්තුවේ ආධුනික විභාගයේ පළමුවන කොටස සමත් නොවන අය අවුරුද්දකට රු. 3,864 වැටුප ලැබීමට එම විභාගයෙන් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් ද සමත් විය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම් :—

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) I. පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙක්;

හෝ

II. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ වෙනත් විෂය යන් හතරකින් සාමාර්ථය ලබා ඉන් විෂයයන් පහක් එකම විභාගයේ දී එකමවර සමත් වී ඇති අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථයක් ;

සහ

කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතිකය දරන්නෙකු විය යුතුය ;

හෝ

III. රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව ඇතුළු විද්‍යා විෂයයන් තුනකින් එක්වර එකම විභාගයේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්වීම ;

සහ

බෝග වගාවන්ට අදාල ක්ෂෙත්‍ර කටයුතු පිළිබඳව තුන් අවුරුදු පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන.— බෝග වගාව පිළිබඳව පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 කට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුතු අපේක්ෂකයින් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපැවැත් වේ.)

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (ඈ. ශු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතිස්ම සහතික බාර ගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(ඈ) ළඟ දී ලබා ගත් චරිත සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම උප වගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

සංලක්ෂ්‍යය.—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

**6. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරතොත් සලකා බලනු නොලැබේ.**

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කොළඹ 7, තැ. පෙ. 1524, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

**8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ** සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව් දන්වනු නොලැබේ.

ආචාර්ය ඊ. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

1973 ක් වූ මාර්තු මස 21 දින,
කොළඹ 7, තැ. පෙ. 1524, 159, ධර්මපාල මාවතේ,
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය

1. සම්පූර්ණ නාමය :————.
    (අ) පෙළපත් නාමය :————.
    (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපත් දිනය සහ 1973 අප්‍රේල් මස 30 වැනි දිනට වයස :————.
4. ජාතිය හා එය කෙසේ ලබා ගත්තේ ද යන වග :————.
5. උපන් ස්ථානය :—
    (අ) අයදුම්කරුගේ :————.
    (ආ) ඔහුගේ පියාගේ :————.
    (ඇ) ඔහුගේ පියපස මුත්තා :————.
    (ඈ) ඔහුගේ පිය පස මී මුත්තා :————.
6. අයදුම්කරු කසාද බැඳලාද යන වග :————.
7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.
8. සිංහල විෂයයෙන් සමත් වූ පරීක්ෂණය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.
9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද ? එසේ නම් දැරූ ධුරය සහ ඉන් අස්වීමට හේතු සඳහන් කළ යුතුය :————.
10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්දක් ඇත් නම් සඳහන් කරන්න :————.
11. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය :————.
    (සහතික පිටපත් ඇමිණිය යුතුය.)
12. වෙනත් විස්තර තිබේ නම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු "අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1204—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

අංකය : සුබෝ/ආය/2/6.

### සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව

### සේද කර්මාන්ත සහායක තනතුරු—සේද කර්මාන්ත ව්‍යාපාරය

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ සේද කර්මාන්ත සහායක තනතුරු සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම්පත් 1973 අප්‍රේල් මස 30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 7, තැ. පෙ. 1524, ධර්මපාල මාවතේ අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂ වෙත ලියා පදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් නොසැපයේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "සේද කර්මාන්ත සහායක තනතුරු සඳහා ඉල්ලුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

2. සේවයේ නියුක්ත කරලීමේ වගන්ති සහ කොන්දේසි :—

(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. මෙම පත්වීම් ප්‍රථම වශයෙන් දෙනු ලබන්නේ අවුරුදු තුනක ආධුනික කාලයක් මතය.

(ii) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් වන බැවින් ඔවුන්ට රජයේ නිවාඩු දිනයන් සහ ඉරිදා දිනයන් විවේක දිනයන් සේ සැලකීමට නොහැකිවේ. නමුත් තමා නැති අවස්ථාවන්හි තමාගේ රාජකාරිය නිසි ආකාරයට කිරීමට කටයුතු සලස්වා ඕනෑම දිනයක, ඕනෑම වේලාවක විවේක ගැනීමට හැකිය.

(iii) තෝරා ගන්නා ලද අපේක්ෂකයින් තම පත්වීම ලබා අවුරුදු 3ක් ඇතුලත දී සිංහල පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා නියම සිංහල පරීක්ෂණ වලින් සමත්විය යුතුය. ප්‍රථම අවුරුද්ද තුළදී දෙමළෙන් වැඩ කිරීමේ දැනුමක් ද ලබා ගත යුතු ය.

3. වැටුප් හා දීමනා :—

මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය.

ඒකාබද්ධ වැටුප : අවුරුද්දකට රු. 3,864—144×19 සහ 180×4—රු. 1,320 (අවුරුද්දකට රු. 4,584 සහ රු. 6,024 පෙර කාර්යක්ෂමතා කඩඉම් ක්‍රියාත්මක වේ.)

4. අවශ්‍ය සුදුසුකම් :—

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ තවත් විෂයයන් 4ක් සමත් විය යුතු අතර, ඉන් විෂයයන් 5ක් එකම විභාගයේදී එක වරම සමත් විය යුතුය ;

සහ

(ii) (අ) නියමිත ආයතනයක සේද වගා කිරීම පිළිබඳ සහතිකයක් දරන්නකු විය යුතු ය ; නැතහොත්

(ආ) කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතිකය දරන්නෙකු විය යුතුය ; නැතහොත්

(ඇ) පටපණු වගාව සම්බන්ධයෙන් අඩුම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය ; නැතහොත්

(ඈ) ඊට සමාන හෝ උසස් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(ආ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන් අවුරුදු 22ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ සේවයේ නියුතු අපේක්ෂකයින් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බලනොපැවැත්වේ.) ;

(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

**සංලක්ෂ්‍යය.**—පටපණු වගාව පිළිබඳව සෑහෙන පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් අවම අධ්‍යාපන සුදුසුකම්වල අවශ්‍යතාව ලිහිල් කළ හැකිය.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම්පත් වලට පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාර ගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) සිංහල විෂයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(ඈ) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම උපවගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දිනට හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතු යයි නිර්දේශ නොකරතහොත් සලකා බලනු නොලැබේ.

7. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කොළඹ 7, තැ. පෙ. 1524, ධර්මපාල මාවතේ, අංක 159 දරණ ස්ථානයේ සුළු අපනයන බෝග අධ්‍යක්ෂට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ආචාර්ය ඊ. ජයනෙත්ති,
සුළු අපනයන බෝග අධ්‍යක්ෂ.

1973 ක්වූ මාර්තු මස 21 දින,
තැ. පෙ. 1524, ධර්මපාල මාවතේ අංක 159 හි
සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ 1973 අප්‍රේල් මස 30 වැනි දිනට වයස :————.
4. ජාතිය හා එය කෙසේ ලබා ගත්තේද යන වග :————.
5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියාගේ :————.
   (ඇ) ඔහුගේ පිය පස මුත්තා :————.
   (ඈ) ඔහුගේ පියපස මී මුත්තා :————.
6. අයදුම්කරු විවාහකද නැද්ද යන වග :————.
7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.
8. සිංහල විෂයයෙන් සමත්වූ පරීක්ෂණය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.
9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? එසේ නම් දැරූ ධුරය සහ ඉන් අස්වීමට හේතු සඳහන් කළ යුතුය : ————.
10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්දක් ඇති නම් සඳහන් කරන්න :————.
11. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය : (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.
12. වෙනත් විස්තර තිබේ නම් :————.

ම විසින් මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරාගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1203—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### අම්පාර දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්දවූර්පත්තු කොට්ඨාශයේ කල්මුනෙයිකුඩි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධුරය

අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනෙයිකුඩි ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ විවාහක මුස්ලිම් පුරුෂ පක්ෂයෙන් ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන්නාවූ අයදුම්කරුවන්ට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායඅලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කායඅල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඅල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල සමිති, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථානයන්හි සහ කායඅලයන්හි ප්‍රදර්ශනය වන දැන්වීම්වල අඩංගු වේ.

3. සියලුම අයදුම්පත් මෙම කායඅලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1973 අප්‍රේල් මස 30 වෙනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

සෝමසිරි මුණසිංහ,
අතිරේක දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

දිස්ත්‍රික් ලේකම් කායඅලය,
අම්පාර, 1973 මාර්තු මස 16 දින.

3–1084—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

**මඩකලපුව දිස්ත්‍රික්කයේ රුගම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ ඒරාවූර් සහ කෝරළපත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

රුගම් උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කරගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පලාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියා පදිංචි තැපැලෙන් 1973.04.30 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1973 මාර්තු මස 19 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

3–1248—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඹවිල්ලි හත්පත්තු කොට්ඨාශයේ (පානගමුව) මුස්ලිම් විවාහ ලේකම් ධුරය.**

වැලඹවිල්ලි හත්පත්තු කොට්ඨාශයේ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක පදිංචිය හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන විවාහක පුරුෂ මුස්ලිම්වරුන්ගෙන් ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර මෙම කායභාලයේ සහ වැලඹවිල්ලි හත්පත්තු කොට්ඨාශය තුල ඇති ප්‍රසිද්ධ ස්ථාන සහ කායභාලවල ප්‍රදර්ශනයකර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායභාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1973. 5. 5 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුයි.

චන්ද්‍රානන්ද ද සිල්වා,
දිස්ත්‍රික් ලේකම්.

1973 ක්වූ මාර්තු 12 වෙනි දා,
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කායභාලයේ දීය.

3–1252—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**මහවැලි සංවර්ධන මණ්ඩලය**

මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත් වල පිරවූ අයදුම්පත් 1973.04.23 දින හෝ ඊට පෙර කොළඹ 5, ජාවත්ත පාරේ අංක 11 දරණ ස්ථානයේ මහවැලි සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. තැපැලෙන් අයදුම් පත් ලබාගනු කැමති අය ලිපිනය ලියා මුද්දර ගැසූ කවරයක් එවිය යුතුය.

**අභ්‍යන්තර විගණක**

**වයස.**—අවුරුදු 35 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය.**—රු. 1,600—50 × 6—රු. 1,900

**සුදුසුකම් හා පළපුරුද්ද.**—වරලත් ගණකාධිකාරීන්ගේ පිළිගත් ආයතනයක ආශ්‍රිතත්වය හෝ පිරිවැය කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය

හා

පිළිගත් ආයතනයක ගණකාධිකාරී/විගණක තනතුරක අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක්. (මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 8 ක් වත් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසුව විය යුතුය.)

**ප්‍රධාන ගණකාධිකාරී**

**වයස.**—අවුරුදු 35 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය.**—රු. 1,800—50 × 6—2,100

**සුදුසුකම් හා පළපුරුද්ද.**—වරලත් ගණකාධිකාරීන්ගේ පිළිගත් ආයතනයක ආශ්‍රිතත්වය හෝ පිරිවැය කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය

හා

ගණකාධිකාරී තනතුරක අවුරුදු 12 ක පළපුරුද්දක්, (මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 8 ක් වත් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසුව විය යුතුයි.)

තෝරාගත් අයදුම්කරු මුදලින් රු. 1,000 ක් හා රු. 5,000 ක විශ්වාස ඇප ඔප්පුවකින් ඇපයක් තැබිය යුතුයි.

**ගණකාධිකාරී I ශ්‍රේණිය**

**වයස.**—අවුරුදු 35 ට නොඅඩු විය යුතුය.

**වැටුප් පරිමාණය.**—රු. 1,400—50 × 6—රු. 1,700

**සුදුසුකම් හා පළපුරුද්ද.**—වරලත් ගණකාධිකාරීන්ගේ පිළිගත් ආයතනයක ආශ්‍රිතත්වය හෝ පිරිවැය කළමනාකාරිත්ව හා ගණකාධිකාරී අයතනයේ සමාජිකත්වය

සහ

ගණකාධිකාරී තනතුරක අවු 10 ක පළපුරුද්දක්, (මෙයින් යටත් පිරිසෙයින් අවු 5ක් වත් ඉහත සඳහන් සුදුසුකම් ලැබීමෙන් පසුව විය යුතුයි.)

තෝරාගත් අයදුම්කරු මුදලින් රු. 1,000 ක හා රු. 3,000 ක විශ්වාස ඇප ඔප්පුවකින් ඇපයක් තැබිය යුතුයි.

**ගණකාධිකාරී II ශ්‍රේණිය**

**වයස.**—අවුරුදු 30 ට නොඅඩු විය යුතුයි.

**වැටුප් පරිමාණය.**—රු. 1,200—50 × 6—රු. 1,500

**සුදුසුකම් හා පළපුරුද්ද.**—(අ) වරලත් ගණකාධිකාරීන්ගේ පිළිගත් ආයතනයක ආශ්‍රිතත්වය හෝ පිරිවැය කළමනාකාරීත්ව හා ගණකාධිකාරී අයතනයේ සාමාජිකත්වය සහ එම සුදුසුකම් ලැබීමෙන් පසු තුන් අවුරුද්දක පළපුරුද්ද,

හෝ

(ආ) වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණයේ සාමාර්ථය හෝ පිරිවැය කළමනාකාරිත්ව හා ගණකාධිකාරී ආයතනයේ I සිට III කොටස් වලින් සාමාර්ථය හා එම සුදුසුකම් ලැබීමෙන් පසු 10 අවුරුද්දක පළපුරුද්ද.

තෝරාගත් අයදුම්කරු මුදලින් රු. 1,000 ක සහ රු. 3,000 ක විශ්වාස ඇප ඔප්පුවකින් ඇපයක් තැබිය යුතුයි.

**ගණකාධිකාරී IV ශ්‍රේණිය**

**වයස.**—අවුරුදු 20 ට නොඅඩු විය යුතුයි.

**වැටුප් පරිමාණය.**—රු. 600—30 × 10—රු. 900

**සුදුසුකම් හා පළපුරුද්ද.**—වරලත් ගණකාධිකාරීන්ගේ පිළිගත් අයතනයක මධ්‍ය පරීක්ෂණය,

හෝ

පිරිවැය කළමනාකාරිත්ව හා ගණකාධිකාරී ආයතනයේ I සිට III දක්වා කොටස්වලින් සාමාර්ථය.

තෝරාගත් අයදුම්කරු රු. 500 ක මුදලින් ඇපයක් හා රු. 3,000ක විශ්වාස ඇප ඔප්පුවකින් ඇපයක් තැබිය යුතුයි.

මණ්ඩල/සංස්ථා හෝ රාජ්‍ය සේවාවේ නියුතු නිලධාරීන් ගෙන් ලැබෙන අයදුම්පත් ඒ ඒ මණ්ඩල/සංස්ථා/දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුයි. රජයේ/මණ්ඩල/සංස්ථා ආදී ආයතනවල නියුක්ත සේවකයින් තෝරාගනු ලැබුවහොත් ඔවුන් තමන් දරණ තනතුරෙන් සම්පූර්ණයෙන් නිදහස් කරවා ගත යුතුය.

ආර්. ඇස්. කුක්,
සාමාන්‍යාධිකාරී,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

11, ජාවත්ත පාර,
කොළඹ 5.

3–1226—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සේවාවේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහතින් දක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 73. 4. 18 දිනට හෝ ඊට පෙර කොළඹ 7, 202, බෞද්ධාලෝක මාවතේ, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ, අතිරේක ලේඛකාධිකාරී වෙත ලැබෙන ලෙස ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ උඩ වම්පස කෙලවරේ තනතුර සඳහන් කළ යුතුය.

තෝරාගත් අයදුම්කරු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කවර මණ්ඩපයක හෝ කයසීලයක හෝ සේවය කිරීමට සූදානම් විය යුතුය.

1. නඩත්තු ඉංජිනේරු :

(අ) වැටුප් ක්‍රමය.—මාසිකව රු. 900—40 සහ 50—1,600

(ආ) සුදුසුකම්.—

(i) බී.ඇස්සී. ඉංජිනේරු විද්‍යා උපාධියක් හා/හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක සංස්ථා සාමාජිකත්වය ;

(ii) ගොඩනැගිලි සැලසුම් කිරීම, ඉදිකිරීම හා නඩත්තු කිරීම හා ඊට අවශ්‍යවන ජලසම්පාදනය, කසල කාණු, මාර්ග හා විදුලිය සැපයුම් පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් හා කොන්ත්‍රාත් කටයුතු හා පිරිස් පාලනය පිළිබඳව පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) රජයේ හෝ පෞද්ගලික ආයතනයක වගකිවයුතු තනතුරක දීර්ඝ කාලීන සේවයක් සහිත ඉංජිනේරුවන්ගේ අයදුම් පත්ද ඉහත (ආ) හි දක්වෙන සුදුසුකම් නොමැත්තේ වුවද සලකා බලනු ලැබේ.

(ඈ) වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සටහන.**—අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ ආරම්භක පියවරට වඩා ඉහල පියවරක තැබීම සලකා බලනු ලැබේ.

2. විශේෂ ආධුනික (විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය)

(අ) වැටුප් ක්‍රමය.—

(i) වසර 3 ක් වූ පුහුණුවීමේ කාලය තුළ මාසිකව රු. 500 ක දීමනාවක් ගෙවනු ලැබේ.

(ii) පුහුණුවීමේ කාලය සතුටුදායකව අවසන් කිරීමෙන් පසුව මාසිකව රු. 640—8 × 20—800 වැටුප් ක්‍රමය යටතට පත් කරනු ලැබේ.

(ආ) **අධ්‍යාපන සුදුසුකම්.**—භෞතික විද්‍යාව හා/හෝ රසායන විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා විද්‍යාවේදී (බී.ඇස්සී) උපාධියක් ලබා සිටිය යුතුය.

(ඇ) **වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

සටහන.—තෝරාගනු ලබන තැනැත්තා මුද්‍රණ කටයුතු පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ගැනීම සඳහා පුහුණුවක් ලබා ගැනීමට යටත් වේ.

3. සාත්තුසේවිකා :

(අ) වැටුප් ක්‍රමය.—මාසිකව රු. 350—18 × 15—620 (රු. 515 ට පෙර නියම කරනු ලබන විභාගයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි.)

(ආ) **සුදුසුකම්.**—සුදුසුකම් ලබාඇති සාත්තු සේවිකාවන්.

(ඇ) **වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

4. බෙහෙත් කලවම් කරන්නා

(අ) වැටුප් ක්‍රමය.—මාසිකව රු.350—18 × 15—620

(ආ) **සුදුසුකම්.**—

අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව ලංකා වෛද්‍ය විද්‍යාල කවුන්සලයෙන් බෙහෙත් කලවම් කරන්නකු වශයෙන් සුදුසුකම් ලැබීමේ කාර්යක්ෂමතා සහතිකයක් ලබා තිබිය යුතුය.

(ඇ) **වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

අතිරේක ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.

73. 3. 21

### ආදර්ශ අයදුම්පත් පෝරමය

...................... තනතුර සඳහා අයදුම් පත්‍රය

1. (අ) මුලකුරු සමග නම :————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————
2. තැපැල් ලිපිනය :————
3. ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය :————
4. (අ) උපන් දිනය :————
   (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. වෘත්තීය සුදුසුකම් :————.
7. සිංහල පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.
8. ඉංග්‍රීසි පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.
9. පාසැලින් අස්වූ පසු නියුක්ත වූ රැකියාවන් පිළිබඳ විස්තර (කරුණාකර එක් එක් ස්ථානයේ සේවයට බැඳුන හා අස්වුනු දිනයන් සහ එක් එක් ස්ථානයේ දී ලද වැටුප් සඳහන් කරන්න) :————.
10. දැනට දරණ තනතුර, ස්ථානය, වැටුප් ක්‍රමය සහ වැටුප: ————.
11. අයදුම්කරු පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :————.
12. වෙනත් කරුණු :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන්ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරාගැනීමට පෙර සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවද, පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි ඒවා බව සොයාගනු ලැබුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකිරීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

3–1225—73.3.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### වෛද්‍ය නිලධාරියකු සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නාවික හමුදාවේ වෛද්‍ය නිලධාරියකුගේ තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලබේ.

2. තෝරා ගන්නා ලද අපේක්ෂකයාට වෛද්‍ය ලුතිනන්වරයෙකු වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායේ නිත්‍ය අධිකාරියක් ලැබෙනවා ඇත.

(3) (අ) **වැටුප්.**—වෛද්‍ය නිලධාරියකුගේ වැටුප් පරිමාණය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරින්ට අදාළ පරිමාණයක් වේ.

(ආ) පහත සඳහන් දීමනාද ගෙවනු ඇත:—

(i) **සේවා දීමනා.**—ලුතිනන් සහ ලුතිනන් කොමාන්ඩර්වරයෙකුට මසකට රු. 180 බැගින්, කොමාන්ඩර්වරයෙකුට මසකට රු. 225 බැගින්.

(ii) රජයේ වෛද්‍ය නිලධාරීන්ට අදාළ වන අයුරින්ම විශ්‍රාම වැටුප් රහිත දීමනා සමාන සුදුසුකම් ඇති අයට ගෙවනු ලැබේ.

(iii) නාවික හමුදා වැටුප් සංග්‍රහයේ ප්‍රතිපාදක සලසා ඇති අයුරින් සුදුසුකම් වැටුප් ගෙවනු ලබේ.

(iv) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ :—

පළමුවෙන්ම සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා රු. 1,000කි. මීට අතිරේක වශයෙන් පත්වීමේ දින සිට නිල ඇඳුම් නඩත්තු දීමනා වශයෙන් මසකට රු. 25 ක මුදලක් ගෙවනු ලැබේ.

4. තෝරා ගන්නා ලද අපේක්ෂකයා විවාහකයෙක් නම්, විවාහක නිවාසයක් (ලබා දිය හැකි නම්) සහ අනුගාමික සේවය සඳහා මසකට රු. 75 ක දීමනාවකට ද හිමිකරුවකුවේ. අවිවාහක නම් සේවක සේවයද සහිතව නිලධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබීමට සුදුස්සෙක් වේ.

5 (i) තෝරා ගනු ලබන අපේක්ෂකයා අධිකාරියට පත් කිරීමට ප්‍රථම දින වන තෙක් විශ්‍රාම වැටුප් හිමි රජයේ තනතුරක් දරමින් සිටියේ නම්, කලින් කල ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර, සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 වැනි දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහයේ සටහන් සහ කොන්දේසි යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් හිමිවේ.

(ii) ඉහත 5 (1) ඡේදයට ඇතුලත් නොවන අපේක්ෂකයෙකු නම් ඔහු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් නොලබන නමුත්, 1972 ජනවාරි 10 දින අංක 3 දරණ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍ර ලේඛනයේ සඳහන් පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ.

(iii) සේවා කොන්දේසි, උසස්වීම් ආදිය ගැන වැඩිදුර විස්තර කොළඹ නාවික හමුදා මූලස්ථානයේ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

6. අයදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් කොන්දේසි සපුරා ලිය යුතුයි:—

(අ) **ජාතිය.**—අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුර වැසියන් විය යුතුය.

(ආ) වයස.—අයදුම්කරුවන් 1973 අප්‍රේල් 30 වැනි දිනට වයස අවුරුදු 32ට වැඩි නොවිය යුතුයි.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්.—අයදුම්කරුවන් ඖෂධ සහ ශල්‍ය වෛද්‍ය පිළිබඳ උපාධිධරයකු හෝ උසස් සුදුසුකම් ඇත්තෙකු විය යුතු අතර වෛද්‍ය වරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා ලංකා වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචි වූවෙකු විය යුතුද, ලියාපදිංචි කළ දින සිට අවුරුදු 2 ක් සේවයේ යෙදී සිටිය යුතුද වේ.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—අයදුම්කරුවන් නාවික හමුදාවේ නියම කර ඇති පරිදි සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතුයි. පත්වීම ලැබීමට මත්තෙන් නාවික හමුදාව විසින් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

7. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව අයදුම් පත් අත් අකුරින් ලියා 1973 අප්‍රේල් 30 වැනි දිනට පෙර නාවික හමුදාධිපති, නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ වෙත එවිය යුතුයි. අයදුම් පත බහා එවන කවරයේ "වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයදුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ.

8. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන අයදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. තෝරා ගනු ලැබුවහොත් එම නිලධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක් ද එහි තිබිය යුතුයි.

9. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකය සහ දැරූ තනතුරු පිළිබඳ සහතික ;

(ඇ) අයදුම්කරු පෞද්ගලිකව හඳුනන වගකිව යුතු පුද්ගලයින් ගෙන් ලබා ගත් යටත් පිරිසෙයින් චරිත සහතික දෙකක්.

10. ලැබෙන අයදුම්පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, ප්‍රථමයෙන් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරා ගැනීම කරනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය කට භාජනය කිරීමෙන් පසුවය.

11. සම්මුඛ පරීක්ෂණයකට තෝරා ගනු ලැබූ අයදුම්කරුවන්ට, සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනවා ඇත. මේ සඳහා අයදුම්කරුවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් අන් දමේ වියදම් සඳහා ලංකාණ්ඩුවෙන් මුදල් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගනු නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

12. ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නාව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු, වැඩ බලන නාවික හමුදාධිපති.

1973 මාර්තු 22 වැනි දින,
කොළඹ, තැ. පෙ. 593,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී ය.

### ශ්‍රී ලංකා නාවික හමුදාව

### වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය (ලංකාවේ පුරවැසියකු නම්, උත්පත්තියෙන් ද නැතහොත් ලියාපදිංචි කරනු ලැබීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සහ දිනය සඳහන් කරන්න) :————.

3. ලිපිනය : රාජකාරි :————.

පෞද්ගලික :————.

4. උපන් දිනය :————.

5. පහත සඳහන් පරිදි මවපියන්ගේ විස්තර :————.

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

6. විවාහක ද අවිවාහක ද යන වග :————.

7. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ඔබ ලබා ඇති ක්‍රීඩා පිළිබඳ දක්ෂකම් :————.

8. පාසැලේ දී හෝ විශ්ව විද්‍යාලයේ දී හෝ ලබාගත් විශේෂ සුදුසුකම් :————.

9. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ සංවිධානයක සේවය කර තිබේද ? :————.

10. මෙම තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

11. මීට පෙර සන්නද්ධ සේවාවක පුරප්පාඩුවක් සඳහා ඉල්ලුම් කර තිබේද ? එසේ නම් එහි ප්‍රතිඵලය :————.

12. ඔබේ පාසැලේ දී සහ විශ්ව විද්‍යාලයේ හෝ චරියාව පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ සහ විශ්ව විද්‍යාලයේ නම | දිනය | | සමර්ථ වූ ආණ්ඩුවේ පරීක්ෂණයය |
|---|---|---|---|
| | ඇතුළත් වීම | පිටවීම | |
| | | | |

13. විශ්ව විද්‍යාලය හැර යාමෙන් පසුව නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවෙහි ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

14. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් .—

1. :————.

2. :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1247—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

යොමු අංකය : සාප/20/165.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු

අධ්‍යාපන අමාත්‍යාංශයේ II වැනි ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙසින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත් පිළියෙල කොට කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත (සාමාන්‍ය පරිපාලන ශාඛාව) 1973 අප්‍රේල් මස 21 වෙනි දිනට කලින් ලැබෙන්නට සැලැස්විය යුතුය. දැනට රැකියාවක් කරන අයෙකු නම් ස්වකීය ඉල්ලුම්පත්‍ර ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බාරගන්නා අවසාන දිනට පසුව එවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන බවද විශේෂයෙන් සැලකිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වාර්ෂිකව රු. 2,760—13 × 60—රු. 3,540 ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් වේ.

**සටහන.**—1969. 10. 1 දිනට ප්‍රථම මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 834—42—රු. 1,338 වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි :**

(i) තනතුර ස්ථිර ය. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක වනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයේ නියුක්ත නැතිනම්, මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත්කරනු ඇත. රාජ්‍ය සේවයේ නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

(ii) අයදුම්කරුවන් තවදුරටත් සේවයෙහි යෙදවීමට නුසුදුසු බව ආධුනික කාල සීමාව ඇතුළත හැඟී ගියහොත්, දැනටමත් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නම්, ආධුනික කාල සීමාව ඇතුළත හෝ එම කාල සීමාව අවසානයේ කලින් දැරූ තනතුරට නැවත පත් කරනු ඇත. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නකු නොවේ නම්, සේවය නතර කරනවා ඇත.

(iii) පත්කරනු ලැබූ අය ආධුනික කාලය තුළදී සිංහල පිළිබඳව නියමිත ප්‍රවීනතාව ලබා නොගතහොත් සේවය අවසන් කරනු ලැබීමට ඔහු යටත් වන්නේ ය. එහෙත්, සිංහල ප්‍රවීණතාව ලබාගැනීම සඳහා ඇත්ත වශයෙන්ම ප්‍රයත්නයක් දරා ඇති බව පත්කිරීමේ බලධාරියාට ඒත්තු යන අවස්ථාවලදී සේවය අවසන් කිරීම පමා කළ හැකිය. නියමිත දිනට පසුව කිසියම් සාධාරණ කාල සීමාවකදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත් පත් කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් සිදුවී ඇති පාඩුව මකාලිය හැකිය.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(i) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට වැඩි විය යුතුය අතර, අවුරුදු 35 කට වැඩි නොවිය යුතුය. (රජයේ සේවයේ නිලධාරීන්ට මෙම වයස් සීමාව අදාළ නැත.) ;

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තවීම ;

(iii) ගණිතය හෝ අංක ගණිතය ඇතුළුව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ;

හෝ

(iv) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය හෝ අංක ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් ;

හෝ

(v) ගණිතය හෝ අංක ගණිතය ඇතුළුව ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුය ;

සහ

(vi) කණිෂ්ඨ කාර්මික ආයතනයක ගෘහ නිර්මාන ශිල්පය පිළිබඳ හෝ සිවිල් ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ ඇවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා සමාර්ථය ලබා තිබීම ;

හෝ

(vii) කණිෂ්ඨ කාර්මික ආයතනයක ගෘහ නිර්මාන ශිල්පය පිළිබඳ හෝ සිවිල් ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ ඇවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම සහ ගොඩනැගිලි නිර්මාන ශිල්පය පිළිබඳ ඇවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් තිබීම ;

හෝ

(viii) රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති (රු. 5,00,000 කට නො අඩු ගොඩනැගිලි පිළිබඳ) කොන්ත්‍රාත්කරුවෙකු යටතේ ඕවර්සියර් කෙනෙකු වශයෙන් ගොඩනැගිලි ඉදි කිරීම් සම්බන්ධ අඩු වශයෙන් පස් අවුරුද්දක පළපුරුදක් තිබීම ;

හෝ

(ix) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන සේවයේ රු. 750 කට නො අඩු මූලික වැටුපක් ලබන (ඒකාබද්ධ වැටුප රු. 2,640 කින්) ගොඩනැගිලි ඕවර්සියර් තනතුරක අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**සැ. යු.**—සෑම අයදුම්කරුවෙකුම ඉහත දැක්වෙන කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරුවන් විසින් සිය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් වන සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ කටයුතු සඳහා දෙන සහතික පත්‍ර, හෝ පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා/හෝ වෘත්තීය සහතික පත්‍ර.

(ඉ) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ මෙම තනතුරට පත් කිරීමට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් මෙම අතුරු ඡේදය යටතේ සහතික එවීම අවශ්‍ය නොවේ).

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. ඉහත සඳහන් 4 වැනි ඡේදයේ ප්‍රකාර සුදුසුකම් ඇති රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. මුද්‍රිත අයදුම්පත් නොමැත. මෙහි පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවාවෙහි තනතුරුවලට කරන පත්කිරීම් සඳහා අදාලවන පොදු කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

9. සියලුම අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ඇත. අයදුම්පත් භාරගැනීම අවසන් කොට සති තුනක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් ඒ බව වහාම ලේකම්, සාමාන්‍ය පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ 2 යන ලිපිනයට දැනුම් දිය යුතුය.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

1973 මාර්තු මස 21 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

යොමු අංකය : සාප. 20/165.

### ආදර්ශ ආකෘති පත්‍රය

II වන ශ්‍රේණියේ ඕවර්සියර් තනතුරු—අධ්‍යාපන අමාත්‍යාංශය

1. සම්පූර්ණ නම :—
(පැහැදිලි අකුරෙන්)
(අ) පෙළපත් නම :————.
(ආ) අනෙක් නම් :————.

2. ලිපිනය :————.

3. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට නියමිත වයස :—
අවුරුදු :——, මාස :——, දින :————.

4. උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

5. පුරවැසි බව සහ එය ලබාගත් අන්දම :———.

පහත සඳහන් අයගේ උපන් ස්ථාන සඳහන් කරන්න :—

(අ) අයදුම්කරුගේ :———.

(ආ) අයදුම්කරුගේ පියාගේ :———.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :———.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :———.

6. අයදුම්කරු විවාහකද, අවිවාහකද හෝ වැන්දඹු ද යන වග : ———.

(විවාහක නම් විවාහ වූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න.)

7. (අ) පොදු අධ්‍යාපනය සඳහා.—

(ආ) වෘත්තීය අධ්‍යාපන සඳහා (ඉගෙනීම ලත් පාසල් හා විද්‍යාල, ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග) :———.

8. (අ) අධ්‍යාපනික සුදුසුකම් (අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳව ලබා ඇති උසස්ම සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුයි.) :———.

(ආ) පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—

(i) සිංහල :———.

(ii) දෙමළ :———.

(iii) ඉංග්‍රීසි :———.

9. ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් යමක් ඇතොත් දින සමග (පිළිගත් ආයතනවල සාමාජිකත්වය, ලැබූ ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකම් ඇතොත් ඒවායේ පිටපත් ඇමිණිය යුතුයි.) :———.

10. පාසල හෝ විද්‍යාල හැරයාමෙන් පසු කළ රක්ෂා, නියුක්තව සිටි හා හැරගිය දින සමග ලද වැටුප් :———.

11. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් පුහුණුවීම් හෝ පළපුරුද්දකම් ———.

12. ඔබ ගැන කරුණු දැනගැනීමට හැකි අයවලුන් තිදෙනෙකුගේ නම්, ලිපින හා නිලතල :———.

13. චරිත සහතිකපත් ඉදිරිපත් කර ඇති සම්භාවනීය පුද්ගලයින් තිදෙනාගේ නම් සහ පදවි නාමයන් (සහතික පත්වල පිටපත් ඇමිණිය යුතුය) :———.

14. ඔබ ණය ගැතිකමින් නිදහස් ද? නො එසේ නම්, කෙතෙක් දුරට ණය ගැතිද ? :———.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත් කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට කලින් දැනගතහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත්කරනු ලැබූවායින් පසු සොයාගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

3–1207—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තු කොට්ඨාශයේ (ඇලබඩගම) මුස්ලිම් විවාහ ලේකම් ධුරය

කටුගම්පොල හත්පත්තු කොට්ඨාශයේ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ කාලයක් පදිංචිව හේතුකොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන විවාහක පුරුෂ මුස්ලිම්වරුන්ගෙන් ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ විස්තර මෙම කාර්යාලයේ සහ කටුගම්පොල හත්පත්තු කොට්ඨාශයේ ඇති ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973.05.05 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

චක්‍රානන්ද ද සිල්වා,
දිස්ත්‍රික් ලේකම්.

1973 ක්වූ මාර්තු 13 වෙනිදා
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

3–1082—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තනතුර

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර කොළඹ 1, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "අධිකාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

(අ) මෙරට ඉල්ලුම් පත් 1973 අප්‍රේල් 30 වැනිදා.

(ආ) විදේශීය ඉල්ලුම් පත් 1973 මැයි 07 වැනිදා.

සටහන :—(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට තම ඉල්ලුම් පත්‍ර ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) *වෛද්‍ය පරීක්ෂණය සහ වියදම් ගාස්තු.*—ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. තෝරාගනු ලැබූ අයදුම්කරු රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ඔහුගේ පත්වීම ප්‍රථමයෙන් තුන් අවුරුදු පරිවාස කාලසීමාවකට යටත් වනු ඇත.

සටහන :—(i) 1971.12.31 දින රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දැරූ යම්කිසි පුද්ගලයෙකු පත්කළහොත් නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් භුක්ති විඳීමට ඔහුට හැකිවනු ඇත.

(ii) විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් දරණ රජයේ සේවකයෙකු තෝරාගනු ලැබුවහොත් පළමුකොට ඔහුගේ පත්වීම නියමිත කාලයක් සඳහා වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය. අවුරුද්දකට රු. 6,720 න් පටන්ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වර්ධක 12 ක් මගින් අවුරුද්දකට රු. 11,040 දක්වා වැඩිවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973 අප්‍රේල් 30 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව.

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හා පරිපාලනීය, ගණකාධිකරණය, ගබඩා කටයුතු සහ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් පුස්තකාල පාලනය පිළිබඳ අවුරුදු 3 කට නොඅඩු පළපුරුද්දක් තිබීම. සිංහල පිළිබඳ හොඳ දැනීමක් තිබිය යුතුය.

(ඈ) පරිපාලනය ගණකාධිකරණය, ගබඩා කටයුතු සහ පුස්තකාල පාලනය පිළිබඳ අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් සහ සිංහල පිළිබඳ විශිෂ්ඨ දැනීමක් තිබේ නම් වයස් සීමාව සහ අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා පහත සඳහන් අයවලුන් ගෙන් ද අයදුම්පත් භාරගනු ලැබේ:—

(i) සාමාන්‍ය ලිපිකරු සේවයේ හෝ ඒ හා සමාන සේව යක I පන්තියේ හෝ උසස් ශ්‍රේණියක නිලධාරීන් ගෙන් හා,

(ii) රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ සහකාර අධිකාරි තනතුර දරන්නාගෙන්,

සටහන.—දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වැඩ කිරීමට හැකියාවක් තිබීම අතිරේක සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උප කෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහ තික හෝ බෞතීස්ම සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස් අධ්‍යාපනික සහතික;

(ඇ) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යයන අධ්‍යක්‍ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය);

(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිල ධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේවුවද, තම ඉල්ලුම් පත්‍ර එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත අනෙක් ලියකියවිලි සියල්ලක්ම ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැ. බ. ලේකම් තැනට හැර මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකු ගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ (I) වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නා වූ අයදුම්කරුවන් විසින් ඒ බව වහාම ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එන්. පී. විජයරත්න,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ
වැඩ බලන ලේකම්.

1973 මාර්තු මස 20 දින,
කොළඹ 1,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේදීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

### ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය

### ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව—රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය :— වර්ෂය :——, මාසය :——, දිනය :——

4. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට තිබෙන වයස :—
අවු :————, මාස :————, දින :————.

5. ඔබ ශ්‍රී ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක්ද ? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද ? යන බව සඳහන් කරන්න :————.

6. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ :————.

(ආ) පියාගේ :————.

(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තා ගේ :————.

7. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.

(ආ) ඔබ විවාහකද, අවිවාහකද, වැන්දඹුවෙක් ද, වැන්දඹුවක ද යන වග :————.

8. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :————.

(1) සිංහල :————.

(2) දෙමළ :————.

(3) ඉංග්‍රීසි :————.

9. වයස 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | වෘත්තීය අධ්‍යාපනය |
|---|---|
| 1. .................................. | 1. .................................. |
| 2. .................................. | 2. .................................. |
| 3. .................................. | 3. .................................. |
| 4. .................................. | 4. .................................. |
| 5. .................................. | 5. .................................. |

10. ක්‍රීඩා පිළිබඳ ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශ යෙහි ඔබ විසින් උසුලන ලද වගකිව යුතු පදවි පිළිබඳ විස්තර :————.

11. (අ) ඔබ ණය ගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණද ? :————.

(ආ) ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබූවෙක් ද ? එසේ නම් දිනයන් සහ නඩු අංකයන් සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

12. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :—
(ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සාමාර්ථ, හා වෘත්තීය සුදුසුකම් වල විස්තර හා ඒවා ලබාගන්නා ලද ආයතනවල නම්) :————.

13. දැනට නිරත රක්ෂාව හා ඊට පෙර කරන ලද රක්ෂාවන් :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| ............... | ............... | ............... | ............... |
| ............... | ............... | ............... | ............... |
| ............... | ............... | ............... | ............... |
| ............... | ............... | ............... | ............... |

14. (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :————.

සැ.යු. :—රජය යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහත 15 වැනි කොටුවේ සඳහන් කළ යුතුය.

14. විශේෂ සුදුසුකම්.—දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ /හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දින යන් ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :————.

15. තවත් තොරතුරු කිසිවක් ඇත්නම් ඒවා :————.

16. මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්ත මේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

3–1214—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### ආයුර්වේද දෙපාර්තමේන්තුව—විශේෂඥ වෛද්‍ය තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පහත සඳහන් "විශේෂඥ වෛද්‍ය තනතුරු" සඳහා ඉල්ලුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 1973 අප්‍රේල් මස 28 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

| තනතුර | පුරප්පාඩු ඇති ස්ථානය |
|---|---|
| 1. කැඩුම් බිඳුම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු ... | ආයුර්වේද මහ රෝහල.<br>අනුරාධපුර ආයුර්වේද රෝහල.<br>රත්නපුර ආයුර්වේද රෝහල. |
| 2. සර්ප විෂ ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු ... | ආයුර්වේද මහ රෝහල.<br>රත්නපුර ආයුර්වේද රෝහල. |
| 3. අක්ෂි රෝග ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍ය තනතුරු ... | රත්නපුර ආයුර්වේද රෝහල.<br>අනුරාධපුර ආයුර්වේද රෝහල. |

**(1) තනතුරු :—**

1. සර්ප විෂ ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ තනතුර }
2. කැඩුම් බිඳුම් ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ තනතුර } පූර්ණ කාලීන.
3. අක්ෂි රෝග ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ තනතුර ... අර්ධ කාලීන.

**2. දීමනා :—**

අර්ධ කාලීන තනතුරු සඳහා මසකට රු. 250 ක දීමනාවක් ද, පූර්ණ කාලීන තනතුරු සඳහා මසකට රු. 450 ක දීමනාවක් ද ගෙවනු ලැබේ.

**3. වයස් සීමාව :—**

1. වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.
2. පහත 4(v) අනුඡේදයේ සඳහන් අය සම්බන්ධයෙන් වයස අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 50 ට වැඩි නොවිය යුතු ය.

**4. අවශ්‍ය අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :—**

(i) අවම වශයෙන් සිංහල හත්වැන්න සමත්ව සිටිය යුතු ය. හින්දි/සංස්කෘත/ඉංග්‍රීසි යන භාෂාවලින් එකක් හෝ වැඩි ගණනක් පිළිබඳ දැනීමක් ඇති අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) අයදුම්කරුවන් තනතුරට අදාල ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ආයුර්වේද වෛද්‍ය වරුන්ගේ විශේෂ නාමලේඛනයේ ලියාපදිංචි වෛද්‍යවරුන් විය යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ලියාපදිංචි වී අවම වශයෙන් අවුරුදු 3 ක් වත් ගත වී තිබිය යුතු ය.

(iii) නිශ්පාදිත සහ අමු ඖෂධ හැඳින ගැනීම හා ඖෂධ නිෂ්පාදනය පිළිබඳව ඇති පළපුරුද්ද සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අවුරුදු 15 ට නොඅඩු පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදුණු පළපුරුද්දක් ඇති අයවළුන් විය යුතු ය.

(v) ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් දෙනු ලබන වර්ෂ 2 ක අදාල ප්‍රතිකාර ක්‍රමය සම්බන්ධයෙන් විශේෂ වෛද්‍ය පුහුණුව සාර්ථකව අවසන් කළ පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයකින් ආයුර්වේදය පිළිබඳව ඩිප්ලෝමාවක් ලබාගත් අයවළුන් විය යුතු ය.

**5. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

(i) මෙම තනතුරු හුදෙක් ම තාවකාලිකය.

(ii) තෝරාගත් වෛද්‍යවරුන්ගේ සේවය සතුටුදායක වුවහොත් දීර්ඝ කිරීම්වලට ඉඩ ඇතිව සාමාන්‍යයෙන් වර්ෂයකට සීමා වෙයි.

(iii) කිසිම හේතුවක් නොදන්වා ඕනෑම අවස්ථාවක සේවය අවසන් කළ හැකි ය.

**6. සේවා කොන්දේසි :—**

(i) තෝරාගනු ලබන පූර්ණකාලීන විශේෂඥ වෛද්‍යවරුන් හදිසි අවස්ථාවන්හි සේවය සඳහා කැඳවීමට හැකිවන සේ අදාල ආරෝග්‍යශාලාවට ආසන්නව පදිංචි විය යුතු ය.

(ii) තෝරාගත් අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කරන කොන්දේසිවලට යටත්ව සේවය කළ යුතු ය.

(iii) ඔවුහු ආරෝග්‍යශාලාවල බාහිරාංශ හා අභ්‍යන්තර රෝගීන්ට ප්‍රතිකාර කළයුතු අතර, ආරෝග්‍යශාලා පුහුණුව ලබන ආධුනික වෛද්‍යවරයින්ට ද පුහුණුවක් ලබා දිය යුතු ය.

(iv) පූර්ණකාලීන වෛද්‍යවරයින් රජයේ නිවාඩු දින හැර අනික් සියළුම දිනයන්හි සේවය සඳහා පැමිණිය යුතු අතර, අර්ධ කාලීන වෛද්‍යවරුන් සතියකට දින 4 ක් පමණක් සේවය සඳහා පැමිණිය යුතු ය.

**7. ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතික වල පිටපත් ද එවිය යුතුය :—**

(i) අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකපත් ඇත්නම් ඒවායේ පිටපත්.

(ii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් ලද සහතික පිටපත්.

(iii) උප්පැන්න සහතිකයේ පිටපතක්.

8. අයදුම්පත් හා සෙසු ලිපි ආදිය මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොව, "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝට්ටේ පාර, කොළඹ 8" කියා එවිය යුතු ය.

යම් ඉල්ලුම්කරුවෙකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමින් වුව ද අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට උත්සාහයක් දැරුවහොත් ඒ හේතුවෙන් ම එකී ඉල්ලුම්කරුගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

ඩබ්ලිව්. බී. වැවේගම;
ආයුර්වේද කොමසාරිස්.

1973 මාර්තු මස 21 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

#### ආකෘතිපත්‍රය

#### ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍ය තනතුරු

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(2) ඉල්ලුම්කරන විශේෂඥ වෛද්‍ය තනතුර :————.

කැමති ස්ථානය අනුක්‍රමයෙන්

(1) :————.
(2) :————.
(3) :————.

(3) වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ අංකය සහ විශේෂඥතාවය :————.

(4) ලිපිනය :————.

(5) උපන් දිනය :————. 197————දිනට වයස :————.

(6) ජාතිය සහ ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.

(7) අධ්‍යාපන සුදුසුකම් :————.

(8) වෘත්තීය සුදුසුකම් :————.

(9) විශේෂ සුදුසුකම් සහ මේ සඳහා කිවහැකි වෙනත් කරුණු පිළිබඳ විස්තර :————.

(10) අයදුම්කරු සම්බන්ධයෙන් තොරතුරු කිවහැකි ඥාතීන් නොවන තුන් දෙනෙකුගේ නම්, තරාතිරම් හා ලිපිනයන් :

(1) :————.
(2) :————.
(3) :————.

..................................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

3-1206—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### වෘද්ධ අධ්‍යාපන නිලධාරි තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ "වෘද්ධ අධ්‍යාපනය පිළිබඳ නිලධාරි තනතුර" සඳහා අයදුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහතින් දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරණ ලද අයදුම්පත් 1973 අප්‍රේල් 30 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "වෘද්ධ අධ්‍යාපනය පිළිබඳ නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමෙ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. තෝරාගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත රජයේ තනතුරක් නොදරයි නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නේ නම්, තවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නැතිනම් මුල් වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලි ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත්, ඔහුගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡෙදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

3. **වැටුප් ක්‍රමය.**—රුපියල් 8,160/–ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රුපියල් 360/– වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් ද, රුපියල් 480/–ක වාර්ෂික වැටුප් වැඩිවීම් 2 කින් ද, වාර්ෂික වැටුප් රුපියල් 9,960/–ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉමකින් ද, යුක්තව වාර්ෂික වැටුප රුපියල් 12,000/– දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය. (1969.10.01 දිනට පෙර මීට අනුරූපව පැවති වාර්ෂික වැටුප් ක්‍රමය රු. 5,520—8 × 360/2 × 480—9,360 විය)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(1) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(2) 1973 අප්‍රේල් 30 වැනි දිනට තමාගේ වයස අවුරුදු 30 ට නො අඩු සහ අවුරුදු 45 ට නො වැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම වයස් සීමාව බල නොපානු ඇත.)

(3) පහත සඳහන් සුදුසුකම් අතරින් යටත් පිරිසෙයින් එකකින් හෝ සමත්ව සිටිය යුතුය.

(අ) වෘද්ධ අධ්‍යාපන ක්ෂෙත්‍රයට සම්බන්ධ විෂයයන්ගෙන් හෝ එම විෂයයන් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි ධරයකු විය යුතුය. ජ්‍යෙෂ්ඨ/අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේ දී හෝ වෙනත් උසස් විභාගයකදී තමන් රාජකාරි කරන අපේක්ෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයෙන් සමත් වී සිටිය යුතුය.

(ආ) මාණ්ඩලික අධ්‍යාපන නිලධාරිවරයකු වශයෙන් හෝ වෘද්ධ අධ්‍යාපන දිසා සංවිධායකයකු වශයෙන් හෝ අවුරුදු 7 ක සේවයක් තිබිය යුතුය.

(ඇ) ගුරුවරයෙකු හා හෝ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි කෙනකු හෝ වෘද්ධ අධ්‍යාපන දිසා සංවිධායකයකු ලෙස හෝ අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 5 ක වත් උපාධිධාරි ගුරුවරයකු ලෙස හෝ ද්විතීය පුහුණු ගුරුවරයෙකු ලෙස විය යුතුය.

4. වෘද්ධ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ යටත් පිරිසෙයින් අවුරුදු 3ක වැඩ කළ පළපුරුද්දක් තිබිය යුතුය.

සංලක්ෂ්‍යය.—පත්වීමෙ කොන්දේසිවල විශේෂයක් දක්වා ඇති කාර් යක්ෂමතා කඩඉම් විභාග එකක් හෝ වැඩි ගණනක් සාමාර්ථය ලබා ඇත්තාවූ ද, අධ්‍යාපනික ආයතනයක ප්‍රධානියෙකු වශයෙන් පළපුරුද්දක් ලබාඇත්තාවූ ද, හෝ වෘද්ධ අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පරිපාලනය පිළිබඳ සහ හෝ වෘද්ධ අධ්‍යාපනයට අදාල අධ්‍යාපනික පරීක්ෂණය පිළිබඳ පුළුල් පළ පුරුද්දක් ඇත්තාවූ ද, මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්/වෘද්ධ අධ්‍යාපන පිළිබඳ ප්‍රාදේශීය සංවිධායකයින් සම්බන්ධයෙන් වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.)

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය (අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසල්වල ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික ;

(සී) චරිත සහතික දෙකක් (මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය) ;

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවල ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියකු ගේ පුද්ගලික නමට නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි ද අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් මෙම කාර්යාලයට ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.
අංක : සා.ප./27/39.

1973 මාර්තු මස,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතුය.)

අධ්‍යාපන අමාත්‍යාංශයේ වෘද්ධ අධ්‍යාපන නිලධාරි තනතුර

1. නම (මුලකුරු සහිතව) :———— මයා/මිය/මෙනවිය.
2. සම්පූර්ණ නම :————.
3. රාජකාරි ලිපිනය :————.
4. පෞද්ගලික ලිපිනය :————.
5. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
   (ආ) එසේනම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද ? :————.
6. උපන් දිනය :—
   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස:— අවු :————. මාස :————. දින :————.
8. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
   (අ) තනතුර :————.
   (ආ) ස්ථිරද, තාවකාලික ද ? :————.
   (ඉ) විශ්‍රාම වැටුප් සහිත ද, රහිතද ? :————.
   (ඊ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටීද ? :————.
   (උ) දෙපාර්තමේන්තුව :————.
   (ඌ) ආයතනය/සේවා ස්ථානය :————.
   (එ) වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය :————.
   (ඒ) දැනට ලබන වාර්ෂික ඒකාබද්ධ වැටුප :————.
9. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර : (සිංහල, ප්‍රවීණතාවය/දෙමළ භාෂාව පිළිබඳව ලබා ඇති සහතිකද ඇතුලත්ව)

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

10. වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

11. සාමාන්‍ය අධ්‍යාපනය ලද ආයතනය :

| ආයතනය | පන්තිය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |

12. කලින් දැරූ තනතුරු : (නියම දිනයන් දක්වමින් හරියටම වකවානු සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | ආයතනය සේවා ස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලික ද? | සිට | දක්වා |
|---|---|---|---|---|---|
| | | | | | |

13. කිසියම් චෝදනාවක් උඩ අධිකරණය මගින් ඔබ වරදකරුවකුව ඇත්තේද? (එසේනම් විස්තර දක්වන්න) :————.

14. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කරනු ලැබුවේ ද? (එසේනම් විස්තර දක්වන්න) :————.

15. මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1190—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් එවීමෙන් ලබා ගන්නා ඉල්ලුම් පත්‍ර මගින් අයදුම් කළ යුතුය.

**1. සහකාර රසඥ**

**සුදුසුකම්.**—විෂයයක් වශයෙන් රසායන විද්‍යාව සහිතව බී. එස්. සී. (සාමාන්‍ය) උපාධිය හෝ රසායන විද්‍යාව විශේෂ විෂයයක් සහිතව බී. එස්. සී. උපාධිය සමග රසායනික කර්මාන්තායතනයක අවුරුදු තුනක (3) පළපුරුද්දක් තිබිය යුතු ය.

**වේතනය.**—තෝරාගනු ලබන අයදුම්කරුලන් දෙවර්ෂයක පුහුණු වීමේ කාලයකට යටත් වන අතර, එම කාල පරිච්ඡේදය තුළ ඔවුන්ට රු. 600 ක මාසික දීමනාවක් ගෙවනු ලබන අතර, පුහුණුවීම සතුටුදායක ලෙස සම්පූර්ණ කළ පසු රු. 600—10×40—රු. 1,000 ක් වන සියලු දීමනා අඩංගු මාසික වේතන පරිමාණයට පත් කරනු ලැබේ.

පිළිගත් රසායනික කර්මාන්තායතනයක යටත් පිරිසෙයින් අවුරුදු 5 ක ප්‍රායෝගික පළපුරුද්දක් ලත් උපාධිධාරීන් ඉහත සඳහන් වේතන පරිමාණයේ පියවරකට කෙලින්ම පත් කිරීම ගැන සලකා බලනු ලැබේ.

සහකාර රසඥ තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පුහුණුවීමේ කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 5ක් සංයුක්ත මණ්ඩලයේ සේවය කරන බවට මුදල් ඇපයක් සහිතව සයුක්ත මණ්ඩලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

**2. විදුලි කාර්මික—8 වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 250—17×15 —රු. 505 සියලු දීමනා අඩංගුව මසකට.

**සුදුසුකම්.**—විදුලි ආයත රේඛා සටහන් (Electrical Circuit Diagrams) කියවීමට සහ තේරුම් ගැනීමට හැකි විය යුතු අතර, අමතර කොටස් (Spare parts) පිළිබඳ නාමාවලියන් කියවීමට සහ ලේඛන පවත්වා ගත හැකි වීම.

කාර්මික ස්විච් යතුරු ආම්පන්න (Industrial Switch Gear) මෝටර (Motors), පරිවර්තයන් (Transformers), පොලොව යටින් කේබල් කම්බි දැමීම සහ කර්මාන්ත ශාලා කම්බි යෙදීම සම්බන්ධ විදුලි වැඩ අළුත්වැඩියා කිරීම් පිළිබඳව අවුරුදු 7 ක පළපුරුද්දක් තිබීම ; හෝ

පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ ඉංජිනේරු ආයතනයකින් අනුමත පුහුණුවීම් පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව කාර්මික විදුලි උපකරණ පවත්වා ගැනීම් පිළිබඳ අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම.

**3. විදුලි කාර්මික—9 වෙනි ශ්‍රේණිය**

**වේතන පරිමාණය.**—රු. 200—15×10—රු. 350 සියලු දීමනා අඩංගුව මාසිකව.

**සුදුසුකම්.**—විදුලි ආයත රේඛා සටහන් කියවීමට සහ තේරුම් ගැනීමට හැකි විය යුතු අතර, උපකරණ කියවීම්, අමතර කොටස් යනාදිය පිළිබඳ ලේඛණ පවත්වා ගැනීමට හැකි වීම.

කාර්මික ස්විච් යතුරු ආම්පන්න, මෝටර සහ කර්මාන්ත ශාලා කම්බි යෙදීම හා සම්බන්ධ විදුලි අලුත්වැඩියා කිරීම් පිළිබඳ අවුරුදු 4 ක පළපුරුද්දක් තිබීම ; හෝ

පිළිගත් කාර්මික විද්‍යාලයයක හෝ ඉංජිනේරු ආයතනයක අනුමත පුහුණුවීම් පාඨ මාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව කාර්මික විදුලි උපකරණ පවත්වා ගැනීම පිළිබඳව අඩු වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් තිබීම.

තෝරාගනු ලබන අයදුම්කරුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වන වේතන පරිමාණවල සුදුසු පියවරකට තැබීම පිළිබඳව සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් කන්තලේ, හිඟුරාණ හෝ වෙනත් ස්ථානයක පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කිරීමට ද සූදානම් විය යුතුය. ඔවුන් විසින් රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් ද ලබා ගත යුතුය.

රජයේ හෝ රජයේ සංස්ථාවන්හි නිලධාරීන් දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්හි ප්‍රධානීන් මගින් අයදුම් පත් එවිය යුතුය.

අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන්, "සභාපති, ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය, තැ. පෙ. 1486, 651, ඇල්විටිගල මාවත, කොළඹ 5", යන ලිපිනයට 1973.04.14 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 මාර්තු මස 16 වෙනි දින,
තැ. පෙ. 1486,
කොළඹ 5.

3–1157—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## වී අලෙවි මණ්ඩලයේ ඇබෑර්තු

### කාර්මික සහකාර VI වෙනි ශ්‍රේණියේ තනතුරු

මෙම මණ්ඩලයේ කාර්මික සහකාර VI වෙනි ශ්‍රේණියේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර 1973.04.20 වෙනි දිනට පෙර කොළඹ 5, එලිබෑන්ක් පාරේ අංක 5 දරණ ස්ථානයේ පිහිටි වී අලෙවි මණ්ඩලයේ, සේවක මණ්ඩල කළමනාකාර නැත වෙත ලැබෙන සේ ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතු අතර, අධ්‍යාපනික, චරිත හා උප්පැන්න සහතික වල පිටපත් ද අමුණා එවිය යුතුය. අයදුම් පත්‍ර අඩංගු ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

තැපෑලේ දී ප්‍රමාද වන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මණ්ඩලය විසින් අයදුම් පත් නිකුත් කර නැත. තමන් විසින් පිළියෙල කර ගත් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.

**අවශ්‍ය සුදුසුකම්.**—(අ) ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයකින් ලබා ගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා ක්ෂෙත්‍රයෙහි කණිෂ්ඨ කාර්මික නිලධාරි (ජේ. ටී. ඕ.) සහතිකය හෝ කාර්මිකඥ සහතිකය හෝ කාර්මික ආයතනයක ඩිප්ලෝමා සහතිකයක් හෝ තිබිය යුතුය. පිළිගත් වැඩපොළ වල, ඉංජිනේරු ආයතනවල සහ කර්මාන්ත ශාලාවල පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) **වැටුප් ක්‍රමය.**—රු. 345—17×15—රු. 600 (සියළු දීමනා සහිතව මසකට)

**සාමාන්‍ය.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට සහල් කෙටීම පිළිබඳ පුහුණුවක් ලැබීමට නියම වන අතර, ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, සහල් නිෂ්පාදන වැඩ පිළිවෙලේ විවිධ අංග පිළිබඳවද, යන්ත්‍රෝපකරණ නඩත්තුව පිළිබඳවද, ප්‍රවීනත්වය සම්බන්ධයෙන් මණ්ඩලය සෑහීමට පත්වීමකට යටත් වනු ඇත.

**පොදු කොන්දේසි.**—(අ) ලාංකිකයින් විය යුතුය.

(ආ) වයස 1973.05.20 වෙනි දිනට අවුරුදු 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. රජයේ හා සංස්ථා සේවකයින්ට ඉහත සඳහන් වයස් සීමාව බලපාන්නේ නැත.

(ඇ) තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා සියළු නීතිරීති හා ව්‍යවස්ථා වලටත්, මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථා වලටත්, එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(ඈ) රජයේ හා ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවකයින් නොවන තෝරා ගන්නා අයදුම්කරුවන් අවුරුදු 2 ක ආධුනික කාලය කට යටත් විය යුතුය. ස්ථිර තනතුරු දරණ රජයේ හා සංස්ථා සේවකයින් අවුරුදු 1 ක පරීක්ෂණ කාලයකට යටත් වනු ඇත.

(ඉ) රජයේ සේවය හා සංස්ථා සේවයේ යෙදී සිටින්නවුන් විසින් ඉදිරිපත් කරන අයදුම් පත්‍ර දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානීන් මගින් එවිය යුතුය.

(ඊ) තනතුරු මණ්ඩලයේ අර්ථ සාධක රෙගුලාසි වලට යටත්වන අතර, මණ්ඩලය විසින් සියයට 9 ක් යොදවන අතර, සේවක සින් සියයට 6 ක් තම වැටුපෙන් අර්ථ සාධක අරමුදලට යෙදවිය යුතුය.

(උ) **අයදුම් පත්වල තමන් ස්ථිරවම පදිංචිව සිටින දිස්ත්‍රික්කය අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.**

(ඌ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් ලංකාවේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

අයදුම්පත් ලැබුනු බව දන්වා එවනු නොලැබේ.

සේවක මණ්ඩල කළමණාකරු,
වී අලෙවි මණ්ඩලය.

තැ. පෙ. 205,
අංක 5, එලිබෑන්ක් පාර,
කොළඹ 5,
1973 මාර්තු මස 20 වෙනි දින.

3–1216—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

### මාණ්ඩලික සහායක තනතුරු

මෙම සංස්ථාවේ මාණ්ඩලික සහායක තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්**—

**වයස.**—අවුරුදු 30 ට අඩුවිය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම්.**—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ උපාධිය ලැබීමෙන් පසුව පරිපාලන මට්ටමේ අවු වශයෙන් එක් අවුරුදු පළපුරුද්දක් හෝ පුහුණුවක් ලබා තිබීම.

පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ ඉංජිනේරු, පරිපාලන අධ්‍යයන, නීති, වාණිජ, විද්‍යා, උපාධිය හෝ ගණිතය, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, යන විෂයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් සමග කලා උපාධිය සමත් වී ඇති අයදුම් කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය.**—රු. 500—10×20—රු. 700.

පළපුරුද්ද හා සුදුසුකම් පිළිබඳ සියළුම විස්තර ඇතුලත් අයදුම් පත් අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7 හි පිහිටි රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවෙහි පිරිස් කළමනාකාර වෙත 1973. 04. 21 දිනට හෝ එයට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

රජයේ සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් එම ආයතනවල නියමිත ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි.

පිරිස් කළමනාකාර.

1973. 03. 20 දා.

3–1229—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

### අර්ධකාලීන වෛද්‍ය නිලධාරි තනතුර

වැලිසර, පිටිකිරි ඇසිරීමේ කර්මාන්ත ශාලාවේ අර්ධකාලීන වෛද්‍ය නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

**සුදුසුකම්.**—යටත් පිරිසෙසින් ඇම්.බී.බී.ඇස්. (ලංකා) සහතිකය සමග පස් අවුරුද්දකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක්.

වැලිසර පිටිකිරි යලි. ඇසිරීමේ කර්මාන්ත ශාලාවේ ඇති චිකිත්සා ගාරය සඳහා ඖෂධ වෛද්‍ය නිලධාරී විසින් සැපයිය යුතු වන අතර, ඒ සඳහා වන වියදම් මණ්ඩලය විසින් පියවනු ලැබේ.

**වේතනය.**—තෝරාගනු ලබන අයදුම්කරුට සියලු දීමනා සහිතව මසකට රු. 400 ක මුදලක් ගෙවනු ලැබේ.

**සේවය කළයුතු වේලාව.**—සාමාන්‍ය වැඩ කරන දිනවලදී දිනකට පැය 2 බැගින් තෝරාගනු ලබන අයදුම්කරු චිකිත්සාගාරයේ සේවය කළ යුතුය.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර සමග නිර්දේශක යන් දෙදෙනෙකුගේ නම්ද සඳහන් කරමින් අයදුම්පත්, 1973 අප්‍රේල් මස 21 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
කිරි මණ්ඩලය.

ජාතික කිරි මණ්ඩලය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට,
කොළඹ 5,
1973.03.21 දින.

3–1250—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලය

### සහකාර සංස්කාරක තනතුරු

ශ්‍රී ලංකා සංස්කෘතික මණ්ඩලයේ සිංහල විශ්වකෝෂයේ මතු දක්වෙන දෙවන ශ්‍රෙණියේ සහකාර සංස්කාරක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. (1) ඉතිහාසය (පෙරදිග) : ලංකා ඉතිහාසය හා ඉන්දියා ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධිය.

(2) ඉතිහාසය (අපරදිග) : අපරදිග ඉතිහාසය පිළිබඳ විශේෂ උපාධිය, දේශපාලනමය වත්මන් ලෝ තතු පිළිබඳ දැනුම විශේෂයෙන් අපේක්ෂිතයි.

(3) ආගම හා දර්ශනය : පෙරදිග ආගම් හා දර්ශන, බෞද්ධ ශිෂ්ඨාචාරය, මනෝ විද්‍යාව, පාලි හා සංස්කෘත භාෂා හා සාහිත්‍ය යනාදිය පිළිබඳ විශේෂ පුහුණුවක් සහිතව ගෞරව උපාධිය.

(4) අර්ථ ශාස්ත්‍රය හා දේශපාලන විද්‍යාව : මෙම විෂයයන් දෙකින් එකක් ප්‍රධාන විෂය වශයෙන් ඇති අර්ථ ශාස්ත්‍ර විශේෂ උපාධිය.

(5) ජීව විද්‍යාව : උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හෝ මෙම විෂයයන් ඇතුළත් සාමාන්‍ය උපාධිය.

(6) භූගෝල විද්‍යාව : විශේෂ උපාධිය.

(7) සමාජ විද්‍යාව : විශේෂ උපාධිය.

3. **සුදුසුකම්.**—ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත සිංහලෙන් ලිවීමෙහි මනා පළපුරුද්දක් සහ ප්‍රමාණවත් ඉංග්‍රීසි දැනුමක් තිබිය යුතුය. විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත 1973.4.19 දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුයි.

4. **කොන්දේසි.**—තෝරාගනු ලබන්නන් යටත් පිරිසෙයින් පස් වසක් වත් සිංහල විශ්වකෝෂයේ සේවය කළ යුතුය. දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට එකඟ විය යුතුය.

5. **වැටුප් සහ දීමනා.**—වැටුප් ක්‍රමය රු. 6,840—4 × 240—රු. 7,800 (වාර්ෂික ඒකාබද්ධ වැටුප) විවාහකයන්ට ඒකාබද්ධ වැටුපට අමතරව රජයේ විවාහ දීමනාව ගෙවනු ලැබේ. සේවක අර්ථ සාධක පහසුකම් තිබේ. සතුටුදායක සේවයකින් පසු පළමුවන ශ්‍රෙණියට උසස් විය හැකිය.

6. ඉල්ලුම් පත්‍ර මෙහි දක්වා ඇති ආකෘතිය අනුව පිළියෙල කරගෙන අවශ්‍ය සහතික පත්‍රවල පිටපත් සමඟ 1973 අප්‍රියෙල් මස 19 දින හෝ ඊට ප්‍රථම "කොළඹ 7, ධර්මපාල මාවතේ අංක 135, ලංකා සංස්කෘතික මණ්ඩලයේ පාලන භාරකරු" වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව දක්වන්න. ඉල්ලුම් පත්‍ර කිසිවකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

හෙ. ආ. පි. අභයවර්ධන,
සංස්කෘතික අධ්‍යක්ෂ හා ලංකා සංස්කෘතික මණ්ඩලයේ
පාලන භාරකරු.

1973 මාර්තු මස 30 දින, කොළඹ 7,
ධර්මපාල මාවතේ අංක 135 හි,
සංස්කෘතික දෙපාර්තමේන්තුවේ දී ය.

### සිංහල විශ්වකෝෂයේ දෙවන ශ්‍රෙණියේ සහකාර සංස්කාරක තනතුරු සඳහා ඉල්ලුම්පත

තනතුර ..........................................................................
(දැන්වීමෙ සඳහන් තනතුරු 7න් අයදුම් කරන තනතුර මෙහි දක්වන්න)

1. සම්පූර්ණ නම :————.

2. මුලකුරු සහිත නම සහ ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. 1973.4.19 දිනට වයස : වර්ෂ :————. මාස :————.
දින :————.

5. (1) ජාතිය :————.

(2) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් නම් අංකය හා දිනය :————

(3) ලාංකිකත්වය පරම්පරාවෙන් නම් අයදුම්කරුගේ පියා උපන් ස්ථානය සඳහන් කරන්න :————.

6. (1) විවාහක අවිවාහක බව :————.

(2) භාර්යාව/ස්වාමිපුරුෂයා රැකියාව කරන ස්ථානය හා තනතුර : ————.

7. අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

| පාඨශාලාවේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් වූ විභාග/ උපාධිය | වර්ෂය | විෂයයන් | සාමාන්‍ය/ විශේෂ |
|---|---|---|---|---|
| | | | | |

(2) වෙනත් සුදුසුකම් :————.

(3) සිංහලයෙන් ලිවීමෙහි පළපුරුද්ද සහ ඉංග්‍රීසි දැනුම ගැන විස්තර දෙන්න :————.

8. පාඨශාලාවෙන් අස්වූ පසු කළ/කරන රැකියා පිළිබඳ විස්තරය :

| ආයතනය | තනතුර | කාලය | විස්තර |
|---|---|---|---|
| | | | |

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වැරදිකරු වී ඇති නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න : ————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයින් තිදෙනාගේ විස්තරය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :

| නම | තනතුර | ලිපිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

මෙම අයදුම් පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය බවද, නිවැරදි බවද මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගුවීමටද, පත්වීම ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලැබීමටද, තිසි දඬුවම් විඳීමටද යටත්වන බව මම දැන සිටිමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

3–1107—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ජාතික කිරි මණ්ඩලය

### III වැනි ශ්‍රේණියේ අභ්‍යන්තර විගණනක තනතුර

කිරි මණ්ඩලීය සේවයේ III වැනි ශ්‍රේණියේ අභ්‍යන්තර විගණනක තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම් පත් පහත සඳහන් ආකාරයට සකස් කර 1973. 4. 19 දින හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,000—50 × 10—රු. 1,500 මසකට (සියළු දීමනා සමඟ)

3. **සුදුසුකම්.**—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(1) 1973. 4. 19 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි බව,

(2) හොඳ කල්ක්‍රියාවෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව,

(3) (i) වරලත්, ඒකාබද්ධ හෝ පිරිවැය හා වැඩ ගණකාධිකාරී වරයෙකු හෝ,

(ii) යටත් පිරිසෙයින් දස අවුරුදු පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් ඉන් පස් අවුරුද්දක්වත් වාණිජ ගිණුම් පිළිබඳ පළපුරුද්දක් තිබෙන රජයේ ගණකාධිකාරී වරුන්ගේ සේවයේ 3 වැනි පන්තියේ හෝ ඊට ඉහළ ගණකාධිකාරී වරයෙකු වීම සහ ලංකා ඒකාබද්ධ ගණකාධිකාරීවරුන්ගේ සහ ගණන් පරීක්ෂක වරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වීම හෝ,

(iii) ලංකා ඒකාබද්ධ ගණකාධිකාරීවරුන්ගේ සහ ගණන් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකුවීම හෝ වරලත් ගණකාධිකාරීවරුන්ගේ (ලංකා) මධ්‍යම පරීක්ෂණයෙන් සමත්වූ සහ පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ සංස්ථාවක ගිණුම් විධායකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් දස අවුරුද්දක පළපුරුද්දක් තිබීම හෝ,

(iv) ඔඩිටර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ ගණන් පරීක්ෂණ සේවයේ අධිකාරීවරුන්ගේ 2 පන්තියේ නිලධාරියෙකුවීම හෝ ඊට ඉහළ නිලධාරිවරයෙකුට සංස්ථාවල ගිණුම් පරීක්ෂා කිරීම සම්බන්ධව යටත් පිරිසෙයින් පස් අවුරුද්දක්ද ඇතුළත් 2 ශ්‍රේණියේ දස අවුරුදු පළපුරුද්දක් තිබීම.

4. සේවා කොන්දේසි.—

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරා ගනු ලැබුවහොත් පත්වීම භාර ගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය ඇඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හල හොත් මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48(අ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් සළකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍ර ලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩල වල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවන නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, එකඟව කටයුතු කිරීමේ කොන්දේසියකට අයදුම්කරු යටත් විය යුතුය.

(ඈ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු සමඟ රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙකු වේ.

6. **ඇප.**—තෝරා ගනු ලබන අයදුම්කරු රු. 7,500 ක් මුදලින් හෝ ඇප ඔප්පුවකින් තැබිය යුතුය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරා ගනු ලබන අයදුම්කරු මණ්ඩලයේ වෛද්‍ය නිලධාරි විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික හෝ භාර නොගන්නා බව සැළකිය යුතුය.)

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන්/විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් හෝ විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතික.

9. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම සභාපති, ජාතික කිරි මණ්ඩලය, තැ. පෙ. 1155, කොළඹ 5 වෙත හැර මණ්ඩලීය සේවයේ අන් කිසිම නිලධාරියෙකුගේ නමට නො එවිය යුතුය.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට, කොළඹ 5,
1973. 03. 07.

### ඉල්ලුම් පත්‍රය

### III වැනි ශ්‍රේණියේ අභ්‍යන්තර විගණනක තනතුර

1. සම්පූර්ණ නම :————.

2. පෞද්ගලික ලිපිනය :————.

3. අයදුම්කරු උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

6. ලබා ඇති උසස්ම වෘත්තීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

7. සිංහල හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :————.

8. කලින් ලබා ඇති පළපුරුද්ද ගැන විස්තර :—
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
සේවය කළ ආයතනයේ නම :————.
දැරූ තනතුර :————.
සේවා කාලය : ......................සිට ......................දක්වා

9. දැනට කරණ රැකියාවේ විස්තර :—
ආයතනයේ නම :————.
දරණ තනතුර :————.
සේවා කාලය : .................. සිට ..................දක්වා.

10. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

3–1213—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ජාතික කිරි මණ්ඩලය

### මුදල් කළමනාකාර තනතුර

කිරි මණ්ඩලීය සේවයේ මුදල් කළමනාකාර තනතුරක් සඳහා ලාංකිකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම් පත් පහත සඳහන් ආකාරයට සකස් කර 1973. 4. 21 දින හෝ ඊට ප්‍රථමයෙන් පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—රු. 1,500—50×10—රු. 2,000 මසකට (සියළු දීමනා සමඟ)

විශිෂ්ඨ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අයදුම්කරුවකු, ඔහු ලබා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද අනුව, ඉහල වැටුප් පරිමානයක් මත එනම් : රු. 1,750—50×10—රු. 2,250 මසකට (සියළු දීමනා සහිතව) පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

3. **සුදුසුකම්.**—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම් කරුවෙකුම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1973. 4. 21 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

(ii) හොඳ කල්ක්‍රියාවෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව.

(iii) වරලත් ගණකාධිකාරීවරයෙකු ලෙස හෝ පිරිවැය හා කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්දක් ලත් අයෙකුවීම ; හෝ

වරලත් ගණකාධිකාරීන්ගේ හෝ පිරිවැය හෝ කළමනාකාර ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වෙමින් ගණන් තැබීමේ ක්ෂේත්‍රයේ අවුරුදු 10 ක අවම පළපුරුද්දක් තිබිය යුතුය. මෙයින් අවුරුදු 6 ක් මධ්‍යම පරීක්ෂණය සමත්වී විධායක තනතුරක සේවය කර තිබිය යුතුය.

4. සේවා කොන්දේසි.—

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරාගනු ලැබුවහොත් පත්වීම භාර ගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය උඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හලහොත් මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48 (අ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට මත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසියකට අයදුම්කරු යටත් විය යුතුය.

(ඈ) තුන් අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ වෙනත් කරුණු සමග රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

5. **වගකීම.**—මෙය ජ්‍යෙෂ්ඨ කලමනාකාර තනතුරක් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරු මණ්ඩලයේ මුදල් සම්බන්ධ කටයුතු වල වගකීම භාර ගැනීම අවශ්‍ය වනවා ඇත.

6. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙකු වේ.

7. **ඇප.**—තෝරාගනු ලබන අයදුම්කරු ඇප තැබිය යුතුය.

8. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අයදුම්කරු මණ්ඩලයේ වෛද්‍ය නිලධාරි විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

9. අයදුම් පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියාපදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික ගේ භාර නොගන්නා බව සැලකිය යුතුය) ;

(ආ) ලබා ඇති ඉහලම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන් / විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය ;

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතික.

10. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම සභාපති, ජාතික කිරි මණ්ඩලය, තැ. පෙ. 1155, කොළඹ 5 වෙත හැර මණ්ඩලීය සේවයේ අන් කිසිම නිලධාරියෙකුගේ නමට නොඑවිය යුතුය.

සභාපති.
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට, කොළඹ 5.

**ඉල්ලුම් පත්‍රය**

**මුදල් කලමනාකාර තනතුර**

1. සම්පූර්ණ නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. අයදුම්කරු උපන් දිනය හා උපන් ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
4. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
6. ලබා ඇති උසස්ම වෘත්තීය සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
7. සිංහල හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :————.
8. කලින් ලබා ඇති පළපුරුද්ද ගැන විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

සේවය කළ ආයතනයේ නම —— දැරූ තනතුර —— සේවා කාලය——

.........සිට.........දක්වා

9. දැනට කරන රැකියාවේ විස්තර :————.

ආයතනයේ නම — දරන තනතුර — සේවා කාලය

.........සිට.........දක්වා

10. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළ හැකි දෙදෙනෙකුගේ නම් :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

03–1212—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**කාර්මික සහකාර නිලධාරීන් සඳහා ඇබෑර්තු**

මෝස්තර නිර්මාණය කිරීම, කාර්මික යන්ත්‍රෝපකරණ පිහිටුවීම සහ ක්‍රියා කරවීම, කර්මාන්තශාලා සහ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ විශිෂ්ඨ කෞශල්‍යයකින් යුත් සුදුසුකම් ඇති කාර්මික සහකාර නිලධාරීන් කීප දෙනෙකු ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අවශ්‍යය. සිවිල්, විදුලි, කාර්මික, රසායනික හෝ රබර් යන ක්ෂෙත්‍රයන්හි පුරප්පාඩු ඇත. සුදුසුකම් සහ වැටුප් ප්‍රමාණ පහත සඳහන් පරිදිය.

(අ) **සුදුසුකම්.**—කණිෂ්ඨ කාර්මික නිලධාරී සහතිකය හෝ සමාන කාර්මික පාඨමාලාවක් පිළිබඳ සහතිකය සමග ආධුනිකත්වයක් සහ සුදුසුකම් ලැබීමෙන් පසුව පිළිගත් ඉංජිනේරු ආයතනයක අවුරුදු 1 ක අවම ප්‍රායෝගික පළපුරුද්ද,

(ආ) **වයස.**—ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 21 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

(ඇ) **වැටුප් පරිමාණය.**—සියළු දීමනා සහිතව මසකට රු. 475—25×12—රු. 775. පරිපාලනය ඇතුළු විපුල පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ඉහතකී වැටුප් පරිමාණයේ සුදුසු පියවරක පිහිටුවීම සඳහා සලකා බලනු ඇත,

පුරප්පාඩු ඇත්තේ මොරටුවේ, කටුබැද්දේ කාර්මික සේවා නියෝජ්‍යායතනයෙහිය. එහෙත් තෝරාගත් අයම්කඳුරුවන්ට රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට නියම කළ හැකිය.

මෙම කාර්යාලයට පුද්ගලිකව පැමිණ හෝ තමාගේ ලිපිනය ලියූ මුද්දර සහිත 9 1/2"×4 1/2" ලියුම් කවරයක් එවීමෙන් හෝ ලබාගත් ආකෘති පත්‍රවල සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර 1973 අප්‍රේල් 10 වැනි දින හෝ ඊට පෙර මෙහි පහත අත්සන් කරන ලද නිලධාරියාගේ නමට එවිය යුතුය.

රජයේ සේවකයින්ගෙන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා වල සේවකයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සැලකිල්ලට භාජනය කරනු ලබන්නේ තෝරාගතහොත් එම නිලධාරියා මුදාහරින බවට දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා ප්‍රධානියා පිටසන් කොට තිබේ නම් පමණි. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ. ප්‍රමාදවී ලැබෙන හෝ තැපැලේදී අතුරුදහන්වෙන ඉල්ලුම්පත්‍ර ගැන මෙම මණ්ඩලය වග කියනු නොලැබේ.

සාමාන්‍යාධිකාරී,
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය.

16, ග්‍රෙගරි පාර,
කොළඹ 7,
1973 මාර්තු මස 21 වෙනි දින.

03–1237—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය — ලංකා කාර්මික විද්‍යාලය**

1973 අධ්‍යයන වර්ෂය

මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තීය අංශයේ පහත සඳහන් පාඨමාලාවට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ :—

**පාඨමාලාව.**—වෙල්ඩින් පාඨමාලාව.

**මාධ්‍යය.**—සිංහල.

**කාලපරිච්ඡේදය.**— හය මාසයයි.

**කාලය.**—අර්ධකාලීන (දිවා).

2. ඉහත සඳහන් පාඨමාලාවට ඇතුළත්වීම තීරණය කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකිනි.

3. **අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්.**—8 වැනි ප්‍රමාණය.

4. **වයස් සීමාව.**—1973. 6. 1 දිනට වයස අවුරුදු 17 වත් 25 වත් අතර විය යුතුය.

5. **අයදුම් කිරීම සඳහා යෝග්‍යතා.**

(අ) මනා චරිතයකින් යුක්තවීම ;
(ආ) ලාංකික පුරවැසියකු වීම ;
(ඇ) අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් තිබීම ;
(ඈ) අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

6. සියළුම ඉල්ලුම් පත්‍ර කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙතින් ලබාගත් ආකෘති පත්‍රවල පුරවා 1973. 4. 19 දිනට හෝ ඊට ප්‍රථම ඔහුට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

7. නියමිත ආකෘති පත්‍රවල නිසි ලෙස පුරවා නොමැති හෝ ප්‍රමාදවී ලැබුණු සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

වී. ඕ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය, කොළඹ 2.
1973. 3. 20.

03–1249—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**චක්‍රලේඛ අංක : 25**

සියලුම පාසැල් ප්‍රධානීන් සහ බාහිර විභාගාපේක්ෂකයින් වෙතය.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය — 1973

උක්ත විභාගය සඳහා යෝජිත කාල සටහන මෙහි පහත දක්වේ. මෙම විභාගයේ ව්‍යවස්ථා අනුව, පහත සඳහන් පරිදි වර්ග කොට ඇති එක් එක් විෂයය කාණ්ඩයකින් යම් අයදුම්කරුවකුට එක් වරකදී පෙනී සිටිය හැක්කේ එක් විෂයයකට පමණි :—

(1) ශුද්ධ ගණිතය/ගණිතය (සංශෝධිත නිර්දේශය 1970)/අංක ගණිතය/වාණිජ අංක ගණිතය.

(2) බුද්ධ ධර්මය/ක්‍රිස්තු ධර්මය (රෝ.ක.)/ක්‍රිස්තු ධර්මය (රෝ. ක. නොවන)/ඉස්ලාම්/හින්දු ධර්මය.

(3) සංගීතය බටහිර/සංගීතය හින්දුස්ථානි/සංගීතය කර්ණාට.

(4) ලී වැඩ/විවීම/මැටි ශිල්පය/ලෝහ වැඩ.

(5) සිංහල භාෂාව/සිංහල භාෂාව (වෛකල්පික).

(6) දෙමළ භාෂාව/දෙමළ භාෂාව (වෛකල්පික).

(7) පාලි/අරාබි/හින්දි/මැලේ/මලයාලම්/මාල දිවයින්/උර්දු/ග්‍රීක්/ප්‍රංශ/ජර්මන්.

(8) සෞඛ්‍ය විද්‍යාව/ව්‍යවහාරික ගණිතය.

(9) ගෘහ විද්‍යාව/ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම.

(10) මැහුම් වැඩ/උසස් ගණිතය/ගණකාධිකරණය.

(11) රසායන විද්‍යාව/වාණිජ්‍යය.

(12) සංස්කෘත/ලතින්/ලඝු–ටයිප් ගැසීම.

(13) ලඝු–ටයිප් ගැසීම සිංහල/ලඝු–ටයිප් ගැසීම දෙමළ/ලඝු–ටයිප් ගැසීම ඉංග්‍රීසි (ලඝු ලේඛනයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ම ටයිප් ගැසීමට ද පෙනී සිටිය යුතුය).

ඉහත දක්වූ ව්‍යවස්ථාවන්ට පටහැනි නොවන අන්දමින් කාල සටහනෙහි එකම වරුවට යෙදී ඇති විෂයයන් දෙකකට පෙනී සිටින අයදුම්කරුවන් වෙතොත් ඔවුන් සඳහා විශේෂ විධිවිධාන යොදනු ලැබේ. දිනකට කණ්ඩායම් තුන බැගින් සිංහල ටයිප් ගැසීමේ පරීක්ෂණය දින තුනක් තුළද දෙමළ සහ ඉංග්‍රීසි ටයිප් ගැසීමේ පරීක්ෂණය දින දෙකක් තුළ ද පවත්වන බව සලකන්න.

**1973 සිට එක් එක් පාසැල් අයදුම්කරු වෙත නිකුත් කිරීම සඳහා කාල සටහන් පිටපත් පාසැල් ප්‍රධානීන් වෙත එවනු නොලැබේ. එහෙයින් මෙම යෝජිත කාල සටහන පාසැල් අයදුම්කරුවන්ගේ දැනගැනීම සඳහා සුදුසු තැනක ප්‍රදර්ශනය කර තැබීමට පාසැල් ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. කෙසේ වෙතත් ප්‍රවේශ පත්‍ර සමග කාල් සටහන් පිටපත් කිහිපයක් එවනු ලබන බැවින් ඒවා අනුසාරයෙන් අවශ්‍ය විස්තර පිටපත් කර ගන්නා ලෙසද අයදුම්කරුවන්ට දැනුම්දීම මැනවි. මේ සම්බන්ධයෙන් කෙරෙනු ලබන විමසීම් සඳහා කොළඹ 2, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දත්ත සැකසුම් ශාඛාවේ විභාග අධිකාරී අමතන්න.**

විභාග කොමසාරිස්,

දත්ත සැකසුම් ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
කොළඹ 2, 1973 පෙබරවාරි 15 වැනි දින.

**කාල සටහන**

| 1973 | උදය වරුව | | සවස් වරුව | |
|---|---|---|---|---|
| දෙසැම්බර් 11<br>අඟහරුවාද | කෘෂිකර්ම විද්‍යාව I<br>කෘෂිකර්ම විද්‍යාව II<br>සංස්කෘත, ලතින්, ග්‍රීක සහ රෝමානු ශිෂ්ටාචාරය<br>ඉංග්‍රීසි සාහිත්‍යය | 9.00— 9.30<br>9.30—12.00<br>9.00—12.00 | හස්ත කර්මාන්තය | 1.00—4.00 |
| දෙසැම්බර් 12<br>බදාද | සිංහල භාෂාව<br>සිංහල භාෂාව (වෛකල්පික)<br>ලඝු ලේඛනය (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) | 9.00—11.40<br>12.00—12.45 | සිංහල සාහිත්‍යය<br>දෙමළ සාහිත්‍යය ඒ<br>දෙමළ සාහිත්‍යය බී | 1.30—4.30 |
| දෙසැම්බර් 13<br>බ්‍රහස්පතින්ද | සෞඛ්‍ය විද්‍යාව I<br>සෞඛ්‍ය විද්‍යාව II<br>ව්‍යවහාරික ගණිතය<br>ටයිප් ගැසීම | 9.00—10.00<br>10.00—12.00<br>9.00—12.00<br>9.00—11.30 | පුරවැසිකම | 1.00—4.00 |
| දෙසැම්බර් 14<br>සිකුරාද | ශුද්ධ ගණිතය I<br>ගණිතය I (සංශෝධිත නිර්දේශය—1970) | 9.00—12.00 | ශුද්ධ ගණිතය II<br>ගණිතය II (සංශෝධිත නිර්දේශය 1970)<br>අංක ගණිතය<br>වාණිජ අංක ගණිතය | 1.30—4.30<br>1.30—3.00<br>1.30—4.00 |
| දෙසැම්බර් 15<br>සෙනසුරාද | ගණකාධිකරණය<br>සංගීතය (හින්දුස්ථානි, කර්ණාට සහ බටහිර) | 9.00—12.00 | ඉංග්‍රීසි භාෂාව | 1.00—4.00 |
| දෙසැම්බර් 17<br>සඳුදා | ජීව විද්‍යාව I<br>ජීව විද්‍යාව II<br>අර්ථ ශාස්ත්‍රය | 9.00— 9.45<br>10.00—12.00<br>9.00—12.00 | ගෘහ විද්‍යාව<br>ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | 1.00—4.00 |
| දෙසැම්බර් 18<br>අඟහරුවාද | රසායන විද්‍යාව I<br>රසායන විද්‍යාව II<br>වාණිජ්‍යය<br>මැහුම් වැඩ I | 9.00— 9.45<br>10.00—12.00<br>9.00—12.00<br>9.00—12.00 | භූගෝල විද්‍යාව I<br>භූගෝල විද්‍යාව II | 12.45—2.45<br>3.00—5.00 |
| දෙසැම්බර් 19<br>බදාද | භෞතික විද්‍යාව I<br>භෞතික විද්‍යාව II<br>මැහුම් වැඩ II | 9.00— 9.45<br>10.00—12.00<br>9.00—12.00 | බුද්ධ ධර්මය<br>හින්දු ධර්මය<br>ඉස්ලාම්<br>ක්‍රිස්තියානි ධර්මය (රෝ.ක.)<br>ක්‍රිස්තියානි ධර්මය (රෝ. ක. නො.) | 1.00—4.00 |
| දෙසැම්බර් 20<br>බ්‍රහස්පතින්ද | ඉතිහාසය<br>පාලි, හින්දි, අරාබි, ජර්මන්, ප්‍රංශ, මාලදිවයින්, මලයාලම්, මැලේ, උර්දු, ග්‍රීක් | 9.00—12.00 | දෙමළ භාෂාව<br>දෙමළ භාෂාව (වෛකල්පික) | 1.00—3.40 |
| දෙසැම්බර් 21<br>සිකුරාද | චිත්‍ර කර්මය II<br>උසස් ගණිතය I | 9—00 12.00<br>9—00 11.30 | චිත්‍ර කර්මය I<br>උසස් ගණිතය II | 1.30—4.30<br>1.30—4.00 |

3–1259—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

අංකය : 1/83/31 (ජී)

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලෙඛකයින්ගේ IIවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සම්මේලන වාර්තා කිරීම–ඉංග්‍රීසි) 1972**

රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලේඛකයින්ගේ II කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති දිනවලදී පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ (ඉංග්‍රීසි) පරීක්ෂණයේදී පහත නම් සඳහන් ලඝුලේඛක/ලේඛිකාවන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි. වාර්ෂික ඒකාබද්ධ වැටුප රුපියල් 5,736 ට ඉහර කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණය ඔවුන් දැන් සම්පූර්ණ කර ඇත.

| නම | දෙපාර්තමේන්තුව | විභාගය පවත් වන ලද දිනය |
|---|---|---|
| හාඩින්, බී. මෙනෙවිය ... | සර්වේ ජනරාල් ... | 1972.6.1 |
| ද සිල්වා, ජී. එස්. මිය. ... | රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | එම |
| ප්‍රනාන්දු එම්. එච්. ජේ. ... | කම්කරු ... | එම |
| කරුණාතිලක, ආර්. මිය. ... | අධ්‍යාපන ... | 1972.6.1 |
| ප්‍රනාන්දු, කේ. බී. ... | විගණකාධිපති ... | 1972.6.9 |
| ගුණවර්ධන, පී. කේ. පී. ... | මහේස්ත්‍රාත් උසාවිය, මාතර | එම |
| ප්‍රනාන්දු, එම්. සී. මිය. ... | ආනයන හා අපනයන | එම |
| වෙත්තසිංහ, ඒ. ඩබ්. ... | යුද හමුදා ... | එම |
| ගුරුගේ, ඊ. ඩබ්ලිව්. පී. ... | දිස්ත්‍රික් උසාවිය, අවිස්සාවේල්ල | එම |
| ප්‍රනාන්දු, එම්. ආර්. බී. මෙනෙවිය... | තක්සේරු ... | එම |

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 19 දින,
කොළඹ–7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදීය.

3–1187—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

අංකය : 1/83/32(ජී).

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි)—1973 මැයි**

1972.5.19 දින අංක 15,014 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලඝු ලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ සඳහන් රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනය යටතේ පවත්නා රජයේ ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ I වැනි සහ II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග 1973 මැයි මස 19 වැනි දින සිට කොළඹ දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාග, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර ඔහු විසින් විභාග පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාගාපේක්ෂකයන් යටත් වේ. විභාගාපේක්ෂකයන් සඳහා වූ නීති රීති මෙම නිවේදනය අවසානයේ වෙනම පළකර ඇත.

3. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම් පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කළ යුත්තේ බාග ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසියක මිස අන් කිසිම ප්‍රමාණයක කඩදාසියක නොවේ. මේ සඳහා එක කඩදාසියක් පමණක් පාවිච්චි කළ යුතුය. අයදුම් පත්‍රය ටයිප් කර පිළියෙල කර ගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිළිව අපේක්ෂකයාගේම අත් අකුරින් පිරවිය යුතුය. 1973 අප්‍රේල් මස 10 වැනි දින හෝ එයට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි අයදුම් පත්‍ර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. අදුම් පත්‍ර විභාග කොමසාරිස් වෙත ඉදිරිපත් කෙරෙන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්ය සඳහා නව ප්‍රවේශක නිලධාරීහු ඔවුන්ගේ අයදුම් පත්‍ර රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කොට, එම භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වුවද ආදි ප්‍රවේශක නිශලධාරීන්ට ස්වකීය කැමැත්ත පරිදි රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගත් භාෂා මාධ්‍යය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ තමන්ගේ අයදුම් පත්‍ර පිළියෙල කිරීමට හා පිරවීමට හැක.

4. අයදුම් පත් පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් විභාග කාල සටහනේ පිටපතකුත් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. යම්කිසි විභාග අපේක්ෂකයකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතකටවත් පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණ හොත්, ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව පහත සඳහන් විස්තරත් සමග කොළඹ, තැ. පෙ. 1503, කොම්පඤ්ඤවීදියේ මැලේ වීදියේ විභාග කොමසාරිස් (විදුලි පණිවුඩ ලිපිනය : "විභාග" කොළඹ) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය :—

(1) විභාගයේ නම :————.

(2) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(3) සම්පූර්ණ ලිපිනය :————.

(4) තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය සහ යැවූ දිනය : ————.

5. හැඳින්වීමේ පත්.—

අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී, තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම, විභාග ශාලාධික්ෂකට ඒත්තු යන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හැඳින්වීමේ පත්‍රිකාවක් ;

(ආ) විභාගය පටන් ගන්නා දිනට අවුරුදු තුනකට වඩා පැරණි නොවූ පාස්පෝට් බල පත්‍රයක් ;

(ඇ) විභාගය පටන් ගන්නා දිනයට අවුරුදු තුනකට වඩා ඉහත නොවූ දිනයක ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක නියමය පිට නිකුත් කරනු ලැබුවාවූ ද, අයදුම්කරුගේ ඡායාරූපය දරන්නාවූ ද, බලපත්‍රයක් හෝ සහතික පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක් ;

(ඈ) පාස්පෝට් ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක් (අයදුම්කරුගේ අත්සන එහි පසු පිටේ යොදා එම අත්සන සහ පසු පිටේ ඡායාරූපය අයදුම්කරුගේම බව දෙපාර්තමේන්තු ප්‍රධානයා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු සහතික කළ යුතුය. සහතික කරන්නාගේ නම, පදවිය, ලිපිනය හා දිනය එහි සඳහන් කළ යුතුය. මෙම ඡායාරූපය පිටපත් විභාග ශාලාධික්ෂක විසින් රඳවා ගන්නුවා ඇත.)

6. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අයකිරීමට තීරණය කර ඇත :—

(අ) පළමුවතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවල, සම්පූර්ණ විභාගය සඳහා රු. 15.00
එක් විෂයකට රු. 7.50

අපේක්ෂකයන් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

ආර්. එම්. බී. සේනානායක,
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 මාර්තු මස 19 දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දී ය.

**අයදුම් පතේ ආදර්ශ ආකෘති පත්‍රය**

**රජයේ ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන I වන සහ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි) ඇතුළත්වීමේ අයදුම් පත—1973 මැයි**

විභාග අංකය :————
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

1. ඉල්ලුම්කරුගේ අගට යෙදෙන නම මුලකුරු සමග :————.
(මහතා/මහත්මිය/මෙනෙවිය) (පැහැදිලි අකුරෙන්)

2. මුලකුරුවලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරෙන්) :————.

3. කාර්යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම සහ කාර්යාලයීය ලිපිනය :————.

4. රජයේ ලඝුලේඛක සේවයට ඇතුළු වූ දිනය :————.

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා ඔබ ආදි ප්‍රවේශකයෙක් ද ? නව ප්‍රවේශකයෙක් ද ?————.

6. මීට ඉහත පැවැත්වූ විභාගයකදී ලඝුලේඛනය සහ යතුරු ලේඛනය හෝ සිංහල/දෙමළ යන විෂයයන්ගෙන් ඔබ සමත් වූයෙහි ද? එසේ නම් පැවැත් වූ දිනය සඳහන් කරන්න: ————.

7. අංකය ජී, (31) සහ 1964.9.9 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛ ලිපියේ විධිවිධාන ප්‍රකාර සිංහල විෂයයෙන් ඔබ නිදහස් කරන ලද්දේ නම් එසේ නිදහස් කරමින් එවන ලද ලිපියේ යොමුව සඳහන් කරන්න :————.

8. ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය (I හෝ II) ඒ පරීක්ෂණයේ විෂයයන් හා මාධ්‍ය සඳහන් කරන්න :————.

9. මෙවර ඔබ පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාගය* (I හෝ II) සඳහා මීට පෙර ඔබ පෙනී සිටියේ ද ? එසේ නම් ඒ කවදාද?

10. ඉහත 9 වෙනි ඡේදයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා මීට පෙර මම පෙනී සිටියෙමි. මෙම ඉල්ලුම් පත්‍රයට අලවන ලද මුද්දර මවිසින් අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බව ප්‍රකාශ කරමි.

| |
|---|
| මුද්දර කොටුව |

————.
විභාගාපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

* අදාළ නොවන වචන කපා හරින්න.

ම විසින් ඉහත දක්වන ලද විස්තර සත්‍ය බැව් සහතික කරමි. මේ විභාගයේ රෙගුලාසි පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය:————.

විභාග කොමසාරිස්,

ඉදිරිපත් කරමි.

(අ) මෙහි විස්තර දැක්වෙන *අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්,

*(ආ) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට මීට පෙර පෙනී නොසිටි බවත්,

*(ඇ) අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දරය/මුද්දර නිසි පරිදි අලවා අවලංගු කර ඇති බවත්

සහතික කරමි.

* අනවශ්‍ය කොටස කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ පදවි නාමය.

දිනය :————.

(ii) යම්කිසි විෂයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බව සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතා ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බව විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස්වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතින්ට දැන්විය යුතුය. විභාගශාලාවේදී ඔබට මා දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල් තීන්ත කූඩු, මකන රබර් කෑලි අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරුව වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්නද තෝරා ගතයුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන්ද බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටු වැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධනේ ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූපසටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

ඔබ්ගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

3–1178—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර ඒ සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු ... | 73.03.02 සිකුරාද ... | 73.02.21 බදාද | දහවල් 12.00 |
| | 73.03.09 සිකුරාද ... | 73.02.28 බදාද | දහවල් 12.00 |
| | 73.03.16 සිකුරාද ... | 73.03.07 බදාද | දහවල් 12.00 |
| | 73.03.23 සිකුරාද ... | 73.03.14 බදාද | දහවල් 12.00 |
| | 73.03.30 සිකුරාද ... | 73.03.21 බදාද | දහවල් 12.00 |
| අප්‍රේල් ... | 73.04.04 සිකුරාද ... | 73.03.28 බදාද | දහවල් 12.00 |
| | 73.04.11 බදාද ... | 73.04.04 බදාද | දහවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද ... | 73.04.11 බදාද | දහවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.18 බදාද | දහවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.